# මහදිවුල්වැව එල්ලංගාව කළමනාකරණ පැතිකඩ

# හා මූලික සංවර්ධන සැලැස්ම



පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම.................................................................................................... | 4 |
| 1.1 | සමනලවැව එල්ලංගාව හා එහි පිහිටීම.......................................................... | 4 |
| 1.2 | සමනළවැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා.................. | 6 |
| 1.3. | සමනළවැව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු............................................. | 9 |
| 1.4 | සමනළ වැව එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම.. | 10 |
| 1.5 | එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම...................................................... | 10 |
| 1.6 | එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය............................................ | 13 |
| 1.7 | මහදිවුල්වැව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය.......................... | 13 |
| 1.8 | මහදිවුල්වැව එල්ලංගා පැතිකඩ සකස්කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය.......... | 14 |
| 1.9 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු.................................................................................................................. | 15 |
| 1.10 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම.............................................................................................. | 15 |
| 2. | එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය............................. | 16 |
| 3. | එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීම දී අනුගමනය කල ක්‍රමවේදය.... | 17 |
| 3.1 | මහදිවුල්වැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම.............. | 18 |
| 4. | මහදිවුල්වැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ................................................ | 19 |
| 4.1 | එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ක්‍රමවේදය | 19 |
| 4.2 | **භූ විද්‍යාත්මක (Geological) තොරතුරු**......................................................... | 20 |
| 4.3 | **පරිසර විද්‍යාත්මක (Environmental)තොරතුරු**............................................. | 21 |
| 4.4 | **එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් පිළිබඳතොරතුරු**............ | 22 |
| 4.5 | **මහදිවුල්වැව එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය**................................. | 23 |
| 4.6 | **සමාජ ආර්ථික තොරතුරු**.................................................................... | 24 |
| 5 | එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග...................................................... | 28 |

5.1 එල්ලංගාවේ උග්‍ර ගැටළු ප්‍රමුඛතාවය අනුව...................................................... 28

5.2 උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්....... 29

6 ඇස්තමේන්තුගත දළ වියදම......................................................................... 39

## 1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.

වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැඟි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කළමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කළමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කළමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කළමණාකරනය කිරීම එල්ලංගා කළමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක් (Profile) පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කළමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කර ඇත. එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.

### 1.1. මහදිවුල්වැව එල්ලංගාව හා එහි පිහිටීම

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඹන්පොල ගොවිජන සේවා බල ප්‍රදේශයේ මහදිවුල්වැව හා උඩදිවුල් වැව ග්‍රාම නිලධාරී කොට්ඨාශ තුල මෙම එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ග්‍රාමීය ප්‍රදේශයක් වන අතර භූගෝලීය වශයෙන් උතුරු බණ්ඩාංක 298 සහ 316 අතර සහ නැගෙනහිර බණ්ඩාංක 145 - 162 අතර පිහිටා ඇත. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පාදෙණියේ සිට අනුරාධපුරය (A 28) දක්වා ප්‍රධාන මාර්ගයට අයත් වන අතර ඊට යාබද නගර ගල්ගමුව හා මහව වේ. මී ඔය ද්‍රෝනියේ තුන්වන උපද්‍රෝනියේ පිහිටා ඇති මෙම එල්ලංගාව අයත් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති 22 ක් පිහිටා ඇත. දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් මහදිවුල්වැව එල්ලංගා පද්ධතිය සඳහා ප්‍රධාන වැව් 03 ක් හා කුඩා වැව් 04 ක් ඇත. මෙම එල්ලංගා පද්ධතිය පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාශ දෙක හෙක්ටයාර 1440.59 ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වී ඇති අතර මෙම බල ප්‍රදේශයේ පාරම්පරික කුඹුරු වගා කරනු ලබන ගොවීන්ද කන්න ක්‍රමයට කුඹුරු වගා කරන ගොවීන් ද සිටී. පිහිටීම අනුව එල්ලංගාවේ මුහුදු මට්ටමේ සිට අඩි 300 ක් පමණ උසකින් පිහිටා ඇත. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා

පද්ධතියම අඩි 300 - 320 වඩා අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. වනාන්තර හෙක්ටයාර 35 කුඹුරු හෙක්ටයාර 62 ක් ද, වන අතර මුඩු බිම් හෙක්ටයාර 24 ක් ද, වැව් වල ජල පෝෂක ප්‍රදේශය ලෙස හෙක්ටයාර 72 ක් පමණද හඳුනා ගත හැක.

මහදිවුල්වැව එල්ලංගා පද්ධතියේ ආරම්භයේ හිටි හාමි මුත්තා නම් සුවිශේෂී පුද්ගලයකු හා සම්භන්ධව පැවත එන බවට ජනප්‍රවාදයන් පවතී. මෙම හිටි හාමි මුත්තා විශාල ශරීරයක් සහ ශක්ති සම්පන්න පුද්ගලයකු බවත් එක් දිනකින් මහදිවුල්වැව නිර්මාණය කළ බව පැවසේ. තවද ප්‍රාදේශීය රජෙක් ලෙස හඳුන්වන භාතිය තිස්ස කුමරු විසින් මෙම ප්‍රදේශය පාලනය කළ ඇති අතර ගවරතිස්ස රජමහා විහාරය කේන්ද්‍ර කොටගත් ඓතිහාසික පන්සල් පද්ධතියක්ද මෙම ප්‍රදේශයේ පිහිටා ඇත. අතීතයේ ඉතා ප්‍රාථමික තත්වයේ මෙම වැව් පැවතියද එල්ලංගාවේ පැවතිය යුතු අංගෝපාංග සියල්ල පැවති බවට ශේෂව පවතින වැව් ලක්ෂණ අනුව නිගමනය කල හැකිය. එහෙත් කාලය ගෙවී යාම හා ජනගහන වර්ධනයත් සමග එල්ලංගාවේ පැවතිය යුතු බොහෝ අංගෝපාංග වර්ථමානය වන විට විනාශයට පත්ව ඇත. කට්ටකඩුව, ගස් ගොම්මන, පෝටා වැටිය, පෙරහන, ගොඩ වල ය.

අතිත ඉතා වැදගත් අංගෝපාංග අද දක්නට නැත. තවද වර්තමාන ගොවි ප්‍රජාව මෙම අංගෝපංග පිළිබඳව හෝ මෙම අංගෝපංග එල්ලංගා පද්ධතිය තුල පිහිටා ඇත්තේ කුමන හේතුවකටද යන්න හඳුනාගැනීමට පවා අවබෝධයක් නැත. මෙම හේතු නිසා එල්ලංගාව හායනයට පත් වීම වර්ථමානයේදී විසදාගත නොහැකි ගැටලුවක් දක්වා වර්ධනය වෙමින් පවතී. මෙහි අවසන් ප්‍රතිඵලය වන්නේ එල්ලංගාව කෘෂිකර්මාන්තයට යොදාගත නොහැකි මට්ටමට ගොඩවීමයි. පහතින් දැක්වනුයේ මහ දිවුල් වැව එල්ලංගාවට අයත් වැව් ය.

මහදිවුල්වැව එල්ලංගාව

1.එඬේරගල වැව

2.යාළු වැව


3.අලුත් වැව

4.මහදිවුල් වැව

5.උඩදිවුල් වැව

6.කුරුන්දේගම වැව

7.දාඹුගලයාය වැව



සටහන 01. මහදිවුල්වැව එල්ලංගා පද්ධතීය

වයනය සහ අන්තර්ගතය මත පදනම්ව අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මූලික

පාංශු වර්ග තුනක ව්‍යාප්තියක් පෙන්වයි. මෙම පාංශු වර්ග වන්නේ

අ) රතු පැහැයට හුරු දුඹුරු පස (RBE)

ආ) රතු පැහැයට හුරු දුඹුරු අඩු තෙතමනය සහිත ග්ලේ පස

ඇ) අඩු හියුමික් ග්ලේ (LHG) පස

එල්ලංගාව තුල මෙම පාංශු වර්ග තුනම දක්නට ලැබේ. එල්ලංගාවේ සමස්ථ සිතියම හා දළ වශයෙන් සටහන් කර ඇති එල්ලංගා ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ගොවින්ගේ පදිංචියෙන් ප්‍රදේශයම ආවරණය කරයි. ඒ අනුව ගෙවතු වගාව හා වෙනත් මානව අවශ්‍යතාවන් සඳහා එල්ලංගාව යොදාගෙන ඇති බව පැහැදිලිව දක්නට ඇත. මේ අනුව මෙම එල්ලංගාව දැනටමත් ජනාකීරණ වී ඇති බවත් නිවාස හා වෙනත් ඉදිකිරීම් වලින් බහුල බවක් පෙන්වයි.


## 1.2 මහදිවුල්වැව එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල කුඩා පරිමාණයේ වැව් රාශියක් පිහිටා ඇත. එකිනෙක මත යැපෙන මෙම වැව් එල්ලංගා පද්ධතීන් සමූහයක් නියෝජනය කරයි. සුලු පරිමාණ වැව් 133 ක් සම්බන්ධයෙන් එල්ලංගා පද්ධති 22 ක් අඹන්පොල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර ඉන් විශාලතම එල්ලංගා පද්ධතිය වන පිදුරුවල්ල එල්ලංගාව වැව් 27 කින් හා මැඩිල්ල අමුණ එල්ලංගාවද වැව් 10 කින් යුක්ත වන අතර මහදිවුල්වැව එල්ලංගාව වැව් 07 කින් සමන්විත වේ. මෙම එල්ලංගාව ආසන්නයෙන්ම පිහිටා ඇත්තේ බොර වැව එල්ලංගාව(වැව් 5), හා ඇලබඩගම එල්ලංගාව(වැව් 2) වේ. සෙසු එල්ලංගා වල වැව් 1 සිට 12 දක්වා පරාසයක විහිදී පවතී. ව්‍යාපෘතිය මගින් තෝරාගත් එල්ලංගා 15 ක වැව් 69 ක් පුණරුත්ථාපනය කර ඇත. එහෙත් මෙම එල්ලංගා නිරීක්ෂණය කරන විට තවත් ලොකු හා කුඩා වැව් රැසක් පිහිටා ඇත. එල්ලංගාව සැලකිල්ලට ගැනීම්දී මෙම සියලු වැව් වල ජල ධාරිතාවය සලකා බැලිය යුතුය. තවද දෙවන අදියර යටතේ මෙම එල්ලංගාවේ තෝරාගත් වැව් 11 ක් පුණරුත්ථාපනය කිරීමට නියමිතය. එල්ලංගා 15 ක වැව් පුණරුත්ථාපනය කලද එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන යටතේ තෝරාගෙන ඇත්තේ වැව් 03 ක් හා ඊට වැඩි සංඛ්‍යාවක් වැව් පවතින්නාවූ එල්ලංගා පමනි. ඒ අනුව අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක වන්නේ පද්ධති 09 ක වන අතර මෙම එල්ලංගා බොහොමයක් එකිනෙකට ආසන්නයේ පිහිටා ඇත .

මෙම සිතියම මගින් එල්ලංගා පිළිබඳව දළ අදහසක් ලබාදීමට උත්සාහ ගෙනඇත.



එල්ලංගාවේ සමස්ථ සිතියම හා දළ වෂයෙන් සටහන් කර ඇති එල්ලංගා ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී ගොවින්ගේ පදිංචියෙන් ප්‍රදේශයම ආවරණය කරයි.





Land Use Pattern in the Ambanpola Division

ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් මහ දිවුල්වැව එල්ලංගාව

<u>වගුව - 01</u>

| අංක | ග්‍රානි. කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාප්තිය | සමස්ත වාරි පද්ධතියේ ජල ධාරිතාවය | පෝෂක කුඹුරු ප්‍රමාණය | යැපෙන පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01. | මහදිවුල්වැව 177 | හෙක් - 900.97 | අක්.අඩි - 413 | අක්.172 | 443 |
| 02. | උඩ දිවුල්වැව 178 | හෙක් - 539.62 | අක්.අඩි -107 | අක්.30 | 65 |
| | එකතුව | හෙක් - 1440.59 | අක්.අඩි - 520 | අක්.202 | 508 |




සිතියම - 01

## 1.3 මහ දිවුල්වැව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු

| තොරතුරු | විස්තරය |
|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | අඹන්පොල |
| මැතිවරණ බල ප්‍රදේශය | යාපහුව |
| ගංගා ද්‍රෝණියේ නම | මීඔය ගංගා දෝණිය |
| එල්ලංගාවේ නම | මහදිවුල්වැව |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | අඹන්පොල |
| ග්‍රාම නිලධාරී වසම් | මහදිවුල්වැව, උඩදිවුල්වැව |
| එල්ලංගාවේ මුලු භූමි ප්‍රමාණය | ව .කි .මී. - 14.4 හෙක්ටයාර 1440.59 |
| ජලපෝශක ප්‍රදේශයේ නම | හිතෝගම ඇල හා අඹගම්මන ඇල |
| පැහැදිළි ජල පෝෂක සංඛාව | 03 |
| කෘෂිකාර්මික කටයුතු සදහා භාවිතා කරණ වැව් සංඛ්‍යාව | 7 |
| එල්ලංගාවේ ජීවත්වන පවුල් සංඛ්‍යාව | 58 |


## 1.4. මහදිවුල්වැව එල්ලංගාව තිරසර ලෙස කළමණාකරනය කිරීමේ වැදගත්කම

මහදිවුල්වැව එල්ලංගාව වර්ග කි මී 14.4 කි. එහි වැව් හා අමුණු 21 ක් පිහිටා ඇත. එම වැව්වලින් දළ වශයෙන් කුඹුරු අක්කර 202 ක් පමණ පෝෂණය වේ. එයට අමතරව හේන් වගාව ලෙස බඩ ඉරුඟු, රටකජු, ලොකු ළූණු හා කොමඩු වගා කරනු ලැබේ. ගෙවතු වගා ලෙස පොල්, අඹ, බුලත් හා පලතුරු ආදියද වගා කරයි. තවද 401 දෙනකු පමණ සංඛ්‍යාවක් කෘෂි කාර්මික කටයුතු වල නිරත වේ. 254 දෙනකු පමණ රාජ්‍ය අර්ධ රාජ්‍ය හා පුද්ගලික අංශයේ රැකියා වල නිරත වේ. එල්ලංගා පද්ධතියන්හි උපරිම ජල ධාරිතාවක් ගැනීමට නොහැකිවීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුව බවත් එයට හේතුව වැලි සහ රොන්මඩ ඇතුළු අවසාදිත ද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් වැව් පතුලේ තැන්පත් වීමය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැවේ පතුලේ ගැඹුර අඩු වේ. එබැවින් පිරනු පස ඉවත් කළ යුතුය. වැවේ වේල්ල බාදනය වී ඇති අතර බොහෝ වැව්වල වාන් හා සොරොව් අලුත්වැඩියා කළ යුතු මට්ටමක පවතී. කෙසේ වුවද වාරිමාර්ග පද්ධති හරහා තිරසාර ජල කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කළ යුතු වේ.

මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාව හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වෙමින් පවතින බව අනාවරනය විය. කෙසේ වුවද එල්ලංගාවේ පිහිටි වැව් 07 ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගෙන ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර මහදිවුල්වැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කළමණාකරන කමිටුව එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලබයි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු දැනට ඌන උපයෝජිතව පවතින ඉඩම් වගා කිරීම සහ වැවේ ඇති අතිරික්ත ජලය වසර පුරා නඩත්තු කිරීමත් සමඟ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවිය හැකි බව ගොවි සංවිධානය ප්‍රකාශ කළේය.

## 1.5. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කළමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කළමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත. එනම් ˝එල්ලන්˝ සහ ˝ගාව˝ යන්නයි. එල්ලන් යනු එල්ලෙන යන්නයි. ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.





රූප සටහන 03 - එල්ලංගාවක ආකෘතියක්

ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණය එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත. එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති තත්වයෙන් එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කළමණාකරන කමිටු පිහිටුවීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව එල්ලංගා කළමණාකරන කමිටු පිහිටවනු ලැබේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කළමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කළමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
  - පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
  - පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
  - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  - වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
  - ප්‍රාදේශීය ලේකම්වරු
  - ගොවි සංවිධාන
  - ප්‍රජා මූලික සංවිධාන
  - ජල සම්පත් මණ්ඩලය
  - ආපදා කළමණාකරන කාර්යාංශය
  - පොලිස් දෙපාර්තමේන්තුව
  - ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
  - පරිසර අධිකාරිය
  - පෞද්ගලික අංශය
  - ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව
  - ප්‍රාදේශීය සභාව
  - සත්ව නිශ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

යන ආයතන වේ. එල්ලංගා කළමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි. රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මුල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලාංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත. තව දුරටත් ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනින් දක්වා ඇත.




රූප සටහන 4 - එල්ලංගා පද්ධති කළමණාකරනය හා සම්බන්ධිත ප්‍රධාන ආයතනික ව්‍යුහය

## 1.6. එල්ලංගා කළමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක් තුලින් ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවට බීමට, රෙදි සේදීමට, ආහාර පිසීමට සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රාජ්‍ය, පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරගත යුතුය. එසේ වුවද නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක්විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගැනීමටත් වඩාත් අවශ්‍ය වී ඇත.

## 1.7. එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා අතීතයේ පැවති ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිලිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් වූ අතර වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කළමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිලිබඳව විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලැබිය. මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කළමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.



## 1.8. මහදිවුල්වැව එල්ලංගා පැතිකඩ සකස්කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශී ය ලේකම් කොට්ඨාසයේ දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ මහදිවුල්වැව හා උඩදිවුල් වැව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල මහදිවුල්ව එල්ලංගාව පිහිටා ඇත. ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල



තෝරාගත් ප්‍රතිලාභීන් වෙත විවිධ ආර්ථික කටයුතු ක්‍රියාවට නංවා ඇත. ආදර්ශ ගෙවතු වගාව, වගා ළිං ඉදිකිරීම සත්ව පාලනය, වැව් පුනරුත්තාපනය හා නවීන කෘෂිකර්ම ක්‍රමවේදයන් හඳුන්වාදීම ආයතන සංවර්ධනය ඉන් ප්‍රධාන වේ. මෙසේ ක්‍රියාත්මක වන සියලු ක්‍රියාකාරකම් නිෂ්පාදන සංවිධාන හා නිෂ්පාදන සංගම් ගොවි සංවිධාන හරහා ක්‍රියාත්මක වේ. මෙම කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීමට හා නියාමනය කිරීම සඳහා මධ්‍ය සංවිධානයක අවශ්‍යතාවය දැනින . ඒ සඳහා ප්‍රධාන වශයෙන් වැව් පුනරුත්ථාපනය වෙමින් පවතින මහදිවුල්ව එල්ලංගාව කේන්ද්‍ර කරගෙන එල්ලංගා කළමනාකරණ කමිටුවක් පිහිටුවන ලදී. මෙම කමිටුව අඹන්පොල ප්‍රාදේශීය ලේකම්ගේ සභාපතිත්වයෙන් හා අදාල සියලු රාජ්‍ය ආයතන හා ස්වේච්ඡා සංවිධානවල සහභාගිත්වයෙන් ද බල ප්‍රදේශයේ සියලුම ගොවි සංවිධානවලින් ද සමන්විත වේ. මෙම කමිටුවේ ලේකම් ධූරය දරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී විසිනි. ලෝක බැංකුවේ හා දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ උපදෙස් අනුව ක්‍රියාත්මක වන මෙම කමිටුවට ඉතා භාරදූර වගකීමක් පැවරිණි. නිරන්තරයෙන් වැව් නඩත්තු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් සමස්ථයක් වශයෙන් වැව් පද්ධතියම ඇතුලත්වන එල්ලංගාව වශයෙන් සැලකිල්ලට ගෙන සංරක්ෂණය කිරීම අත්‍යවශ්‍ය බවත් ඒ සඳහා එල්ලංගාවේ පවතින තත්වය ප්‍රථමයෙන් අවබෝධ කරගැනීමත් අත්‍යවශ්‍ය විය. ඒ සඳහා එල්ලංගාව තුල ඇවිද ගොස් තොරතුරු රැස් කර ගැනීමටත් එම දත්ත හා ආයතනමය වශයෙන් ලබා ගන්නා දත්ත පදනම් කරගෙන මූලික වශයෙන් හරස්කඩ වාර්තාව (පැතිකඩ/Cascade Profile ) සකස් කිරීම මෙහි ආරම්භක අදියර වේ. මෙම වාර්තාවෙන් එල්ලංගාවෙ පවතින ගැටලු හා උග්‍ර ගැටලු ලේඛණයක් හා අවශ්‍යතා හා විසඳුම් යෝජනා පිළිඹිමු වනු ඇත. මෙහි දෙවන අදියර වන්නේ සකස්කිරීමයි. මෙම සැලැස්ම අදාල රාජ්‍ය ආයතන මගින් ක්‍රියාවට නැඟීමත් ඒ සඳහා ප්‍රමානවත් ප්‍රතිපාදන ලෝක බැංකුව මගින් ලබාදීමත් මෙහි අවසන් අදියරවේ. මෙය මහත් බාරදූර වගකීමකි. ඒ අනුව අඹන්පොල ප්‍රාදේශීය ලේකම්/ එල්ලංගා කළමනාකරණ කමිටුවේ සභාපතිගේ ප්‍රධානත්වයෙන් සියලු අදාල රාජ්‍ය ආයතන වල හා ගොවි සංවිධාන වල සහභාගිත්වයෙන් වයඹ පළාත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ අනුග්‍රහයෙන් මෙම හරස්කඩ චාරිකාව පවත්වන ලදී.

ඉහත හරස්කඩ චාරිකාවෙන් ලබාගත් තොරතුරු පමනක් මෙම වාර්ථාවට ප්‍රමාණවත් නොවූ බැවින් රාජ්‍ය ආයතන වලින් ලබා ගන්නා ලද තොරතුරු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සම්පත් පැතිකඩ පරිශීලනය කිරීමෙන්ද ගොවි සංවිධාන හා ගොවින්ගෙන් විවිධ අවස්ථාවලදී ලබාගත් තොරතුරු ද මෙම වාර්ථාව සඳහා පදනම් කරගනු ලැබීය.

## 1.9. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කළමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කළමණාකරනය කල යුතුවේ. ඒ අනුව පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කළමණාකරන සැලැස්මක් සකස් කරනු ලැබේ.

1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ විශේෂයෙන් මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම.

2. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතනයන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කළමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.

3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 1.10. එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කළමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ මගින් ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එලිපෙහෙලි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරයත් එහිදී පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීමට හැකියාව ලැබේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවීන්ට

එල්ලංගාව පිලිබඳව නිවැරදි චිත්‍රයක් දැකීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කළමණාකරන මූලික සැලැස්මක් සැකසීම(Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කළමණාකරන සැලැස්ම එල්ලංගා කළමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කර ඇත.

## 02. එල්ලංගා පැතිකඩ සකස් කිරීමේදී භාවිතා කල ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, මහදිවුල්වැව එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතන සම්බන්ධිත එල්ලංගා කළමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීමට සඳහා එල්ලංගා කළමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කළමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය. එල්ලංගා කළමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය. පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූවිද්‍යාත්මක, පරිසරවිද්‍යාත්මක, ජලවිද්‍යාත්මක, සිතියම්විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරුකිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතාකරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතුවී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

- රැස්වීම් පැවැත්වීම
- ද්විතීය දත්ත එකතු කිරීම
- හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
- එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
- එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම

- එල්ලංගා පැතිකඩ සැකසීම

  ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

- එල්ලංගා සැලැස්ම සැකසීම
- පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම
- එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන(Medium Term) හා දීර්ගකාලීන(Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාල වකවානු, එල්ලංගා කළමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කළමනාකරන සැලැස්මට ඇතුලත් කර ඇත.

## 03. එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීම දී අනුගමනය කල ක්‍රමවේදය

එල්ලංගා කළමනාකරණය ක්ෂේත්‍ර ගත මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධ කාර්යයකි. ඒ සඳහා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමට පෙර එල්ලංගා පැතිකඩ සකස් කලයුතු අතර එහිදී එල්ලංගාවේ භූවිද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජලවිද්‍යාත්මක, සිතියම්ව විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්තවිශ්ලේෂනය, වාර්තාලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශවකරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු කරගැනීම සඳහා බහු විධි දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසිම සඳහා දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී

1. රැස්වීම් පැවැත්වීම
2. ද්විතීය දත්ත එකතු කිරීම
3. හරස්කඩ චාරිකාව වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
4. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම

5. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු පුරෝකථනය කිරීම හා එල්ලංගා පැතිකඩ සැකසීම

6. ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම, යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම

7 එල්ලංගා සැලැස්ම සැකසීම

8 පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කළමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කිරීම, එල්ලංගා කළමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් හඳුනා ගැනීම සහ යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා දල ඇස්තමේන්තුවක් හා කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ගකාලීන වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු එල්ලංගා කළමණාකරන කමිටු සැලැස්ම සැකසීම.

## 3.1 මහදිවුල්වැව එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම

**මහදිවුල්වැව** එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග හඳුනා ගැනීම එල්ලංගා පැතිකඩ හා එල්ලංගා කළමණාකරන සැලැස්ම සැකසීමේ ක්‍රියාවලියේ කාර්යයන් අතර එක් ප්‍රධාන කාර්යයකි. දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන පළාත් 6ක දිස්ත්‍රික්ක 11ක එල්ලංගා පද්ධති 53ක් ආවරණය වන පරිදි එල්ලංගා කළමණාකරන කමිටු 53ක් පිහිටුවීමට පහසුකරනය කිරීමෙන් පසුව, ව්‍යාපෘතියේ ඊළඟ කාර්යය වී ඇත්තේ සෑම එල්ලංගා කළමණාකරන කමිටුවක් සඳහාම එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කළමණාකරන සැලැස්මක් සකස් කර දීමට එල්ලංගා කළමනාකරණ කමිටුවට සහාය වීමයි. එල්ලංගාව සහ එල්ලංගාව මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමට එල්ලංගා පැතිකඩ සැකසීම අතිශයින් වැදගත් වන අතර එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රායෝගික එල්ලංගා කළමණාකරන සැලැස්මක් සැකසීමට එල්ලංගා පැතිකඩ ඉතා වැදගත් වේ. ඒ අනුව අභියෝග හඳුනා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර තීරණය කිරීම, දත්ත එකතු කිරීම හා උත්පාදනය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේද තීරණය කිරිම, එල්ලංගා පැතිකඩේ හා එල්ලංගා කළමණාකරන සැලැස්මේ දත්ත හා තොරතුරු ජනනය කිරීම සඳහා ආකෘති සැකසීම සම්බන්ධයෙන් දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් හා ලෝක බැංකු නිලධාරීන් එක්ව උපදේශන මට්ටමේ රැස්වීම් කීපයක්ම පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලේඛණ පරිශිලනය කිරීමට අමතරව සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකා ක්‍රමවේදය එල්ලංගාව අධ්‍යනය කිරීම සඳහා ප්‍රධාන ක්‍රමවේදයක් ලෙස භාවිතා කරන ලදී. එහිදී එල්ලංගා හරහා චාරිකා කරමින් එල්ලංගාවේ ස්වභාවය සහ මෙහි දක්වා ඇති ප්‍රධාන අභියෝග හඳුනා ගන්නා ලදී. අභියෝග ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකට වර්ගීකරණය කරන ලදී. ඒවානම්

| | |
|---|---|
| 1. භූගෝලවිද්‍යාත්මක | 5. සමාජ ආර්ථික |
| 2. භූවිද්‍යාත්මක | 6. කෘෂිකාර්මික |
| 3. ජලවිද්‍යාත්මක | 7. වාරිමාර්ග කළමණාකරන |
| 4. පාරිසරික විද්‍යාත්මක | 8. පෝෂිත ප්‍රදේශයේ තත්වය |

යන ආදියයි.

මේවා එල්ලංගා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේදී භාවිතා කිරීම සඳහා එල්ලංගා පැතිකඩේ විස්තරාත්මකව දක්වා ඇත. මෙම අභියෝග තව දුරටත් විග්‍රහ කර උග්‍ර ගැටලු හඳුනා ගෙන ඒවායේ නිවැරදිතාවය තහවුරු කර ගෙන ඒවා පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, පාර්ශවකරුවන්ගේ සහ ආධාර කරුවන්ගේ කඩිනම් අවධානය යොමු කරවීමට එල්ලංගා කළමනාකරණ සැලැස්මට ඇතුලත් කර ඇත.

## 04. මහදිවුල්වැව එල්ලංගාවේ වර්තමාන පැතිකඩ

## 4.1 භූගෝලීය (Geographical) තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු මායිමේ පිහිටා ඇති අතර උතුරින් ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද, දකුණින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ද නැගෙනහිරින් ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ට ද මායිම් වන අතර බටහිර මායිම වන්නේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. මෙහි භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 14.4 ක් වේ. භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනී. උපරිම උන්නතාංශය අඩි 315 ක් වන අතර එය දකුණු මායිමට ආසන්නව පිහිටා ඇත. අවම උන්නතාංශය අඩි 212 ක් පමණ වන අතර එය උතුරු මායිමේ මී ඔය ආසන්නයේ පිහිටා ඇත. මහදිවුල්වැව එල්ලංගාව ඉතා කුඩා එල්ලංගාවකි. එහි වැව් 07 ක් පිහිටා ඇති අතර එල්ලංගාව නැගෙනහිර සිට බටහිර දෙසට කි.මී. 12 ක් පමන දක්වා විහිදී යයි. විශේෂිත උස් කඳු වැටි ප්‍රදේශය තුල දක්නට නොමැකි අතර ප්‍රදේශයේ පවතින උන්නතාංශය අනුව එල්ලංගාවට ලැබෙන වර්ෂාවෙන් ගලා යන ජලයෙන් වැව් පෝෂණය වේ. ස්භාවික වනාන්තර දක්නට

නැත. එල්ලංගාව තුල ගෙවතු වගාව හා නිවාස කෘෂිකාර්මික ඉඩම් පිහිටා ඇත. මෙම භූ විශමතාවය අනුව වේගවත්ව වැව් තාවුල්ලට වර්ෂා ජලය ගලා යයි. ප්‍රදේෂයේ පවතින්නේ රැලි සහිත භූමියකි. මෙම භූ විශමතාවය අනුව ලැබෙන වර්ෂාපතනය වැව් වලට එක් වනවා හැර විෂේශිත ජල මාර්ග හෝ ඇලවල් නැත. **මහදිවුල්වැව** එල්ලංගාව මෙන්ම ප්‍රදේශයේ සෙසු එල්ලංගා වලින් පිටතට ගලායන ජලය ඉගිනිමිටිය ජලාශයට රැස්වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මුලුමනින්ම ඉගිනිමිටිය ජලාශයේ පෝෂිත ප්‍රදේශය ලෙස සැලකිය හැකිය .

## 4.2. භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මහදිවුල්වැව එල්ලංගාව හෙක්ටයාර් 1440.59 කින් යුක්තය. මෙය ඉතා කුඩා භූමි භාගයනක පිහිටා ඇති අතර කුඩා වැව් කිහිපයකින් යුත් එල්ලංගාවකි ජනාවාස අතර කුඩා ලඳු කැලෑ මෙම එල්ලංගාව තුල පිහිටා ඇත. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ භූමි ස්භාවය මෘදු බෑවුමක් හා කුඩා වල ගොඩැලි සහිත තැනිතලාවකි. ජලාප්‍රවාහන රටාව ප්‍රධන වශයෙන් මී ඔය ගංගා ද්‍රෝණියේ හා සම්බන්ධ වන අතර එය හිතෝ-ඇල සහ අඹගම්මන ඇල ප්‍රධාන ජල මූලාශ්‍ර වේ. අඹන්පොළ ප්‍රදේශයට පතිත වන වැසි ජලය දකුණු ප්‍රදේශයේ සිට බස්නාහිරට ගලා බසින අතර පසට උරා ගන්නා හා වැව් වලට එකතුවන වැසි ජලය හැර ඉතිරිය ගලා ගොස් මී ඔයට එකතු වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දක්නට ලැබෙන සියලු ස්වාභාවික ජල මාර්ග බොහෝ ස්ථානවල අවහිර කර ඇති අතර වගාව සඳහා ජලය රඳවා ගැනීමට කුඩා වැව් හා අමුණු රාශියක් ඉදිකර ඇත. වැසි සමයේදී, ජලය වේගයෙන් ගලා යාම නිසා දැඩි පාංශුඛාදනයක් සිදු වේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඇති මුළු කුඩා වැව් වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කරයි. වියළි කාලවලදී භූගත ජල මට්ටම අඩි 25ක් පමණ ගැඹුරට දක්නට ලැබෙන අතර දැනට ඇතැම් ගම්මානවල කෘෂි ළිං සහ නළ ළිං හරහා මෙම ජලය ලබා ගනී. වර්ෂාවෙන් ලැබෙන ජලය කාලීන ජල මාර්ග ඔස්සේ ගලා ගොස් සුලු කාලයකින් සිදීයයි. මෙම කුඩා ජලාශවල වාන් දමන කාලයද ඉතාමත් කෙටිය. එසේ වන්නේ වැව් ඉස්මත්තේ වැසි ජලය රදවා ගැනීමට ප්‍රමානවත් පෝෂිත ප්‍රදේශයක් නොමැති නිසාය.

රූප සටහන 6 - කුඩා ලඳු කැලෑ

## 4.3 පරිසර විද්‍යාත්මක (Environmental) තොරතුරු

මෙම එල්ලංගා පද්ධතිය තුල පවතින වැව් හා අමුණු අතරින් වැව් 03 ක් දේශගුණ සුහුරු කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබයි. මෙම වැව් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගනී. රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම කුඩා ප්‍රජාවක් පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය ගෙවතු ගොඩ ඉඩම් හා හේන් බෝග වගාවන්ගෙන් සමන්විතව ඇත. බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලේ පිහිටි කුඹුරු යායෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති කට්ටකඩුව බොහෝ වැව්වල දක්නට නැත. වැව් බැම්ම හරහා අනවසර මාර්ග දක්නට ඇත. වාර්ෂිකව වැව් ඉස්මත්තේ පිහිටි කුඹුරු වගාව නිසා පස සේදී පහලින් පිහිටි වැවට එකතු වන රොන්මඩ හා පස් අංශු අති විශාලය. මෙම වැව් වල ඉස්වැටිය, පෙරණය හා ගොඩවල ප්‍රතිසංස්කරණය වී නැත. වැව් ඉස්මත්ත මුලුමනින්ම අනවසර අල්ලා ගැනීම් වලට ලක් වී ඇති අතර අනවසර අඩි පාරවල් දක්නට ඇත. වැව ඉස්මත්ත පදිංචිය සඳහා භාවිතා කිරීමත් නොයෙකුත් අක්‍රමිකතා සඳහා භාවිතා කරමින් තම පුද්ගලික අවශ්‍යතා ඉටුකර ගැනීමට වෙර දරන ගැමි ජනතාවක් මෙන්ම වැව් පුනරුත්ථාපනය කර ගොවිතැන ශක්තිමත් කර ගැනීමට වෙර දරන ගොවි ජනතාවක්ද මෙම එල්ලංගා පද්ධතිය අයත් භූමි බාගය තුල ජීවත් වේ.

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මෙම වැව් පද්ධති පුණරුත්ථාපනය කිරීමට යෝජිතව ඇත. වාරිමාර්ග පරිසර පද්ධතිය නඩත්තු කර ගැනීමට ගොවි සංවිධාන වලට අවශ්‍ය තාවයක් පැවතුනද ඒ සඳහා මූල්‍යමය හැකියාවක් නොමැති බව පෙනේ. තවද ගොවි සංවිධානවල සාමාජිකත්වය නොදරන ගැමියන් වාරි ප්‍රතිසංස්කරණයන්ට විරුද්ධතාවයන් දක්වයි. ගම තුල නිරන්තරයෙන් ගොඩනැගිලි ඉදිවෙමින් පවතී. වෘක්ෂලතා ආවරණය පවතින්නේ 15% පමන වේ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන සංරක්ෂණ කලාප සුලු වශයෙන් පැවතියද අනවසර දැව කැපීම් හා සත්ත්ව දඩයම බහුල බව පරිසර අධ්‍යනයේදී අනාවරණය විය. මෙම එල්ලංගාව තුල ජනගහනයේ ක්‍රමික වර්ධනයක් දක්නට ලැබේ. සතුන්ගෙන් සිදුවන හානිය( රිළවුන් අලින්



මොණරුන් හා ඌරන් ) ඉතා විශාලය. මේ නිසාම ගොවීන් වෘක්ෂ ලතා සිටුවීම සම්බන්ධයෙන් අකමැත්තක් දක්වන්නා සේම ගොඩ ගොවිතැන සඳහා වෙහෙස වීමට මැලිකමක්ද දක්වයි. රිළවුන් මොණරුන් හා අලින්ගේ ගැවසීම නිසා ගස් හා පඳුරු කපා දැමීමට ගොවීන් පෙලඹී ඇත. ඌරන් හා මුවන් දඩයම් කිරීම ද දැකිය හැකිය. වැව් වලට ඉහලින් පවතින හේන් වගාවන් නිසා වර්ශාකාලයේදී පාංශු ඛාදනය සිදුවේ නමුත් සමහර හෙන් වගාවන් වලට යොදන ලද අලි පැමිණීම අවහිර කරන අගල් නිසා වැව් ගොඩවීම විශාල ලෙස පාලනය වී ඇත. මහ කන්නයේ හේන් වගාවන් සිදු කරනු ලබයි. මේ සඳහා ගිනි තැබීම් බහුලව දැකිය හැකිය. නමුත් වන සංරක්ෂණ කලාප වල හේන් වගාවන් සිදු නොකරන බව දැකගත හැකිය.

## 4.4. එල්ලංගාව තුල දැනට සිදුකරමින් පවතින ඉදිකිරීම් පිලිබඳ තොරතුරු

එල්ලංගාව තුල විශේෂ ඉදිකිරීම් දක්නට නැත. එහෙත් එල්ලංගාවේ වැව් බැම්ම හරහා කුඹුරු වලට යෑමට සකසා ගත් තාවකාලික මාර්ගයන් ඇත. වගාබිම් හා බොහෝ අවදානම් ස්ථාන වල අලිවැට ඉදිකර ඇතත් මේවා විධිමත්ව ඉදිකරන ලද වැටවල් නොවේ. අනතුරුදායක වැටවල් ඒ අතර ඇත. එල්ලංගාව මුලුමනින්ම පාහේ ජනාවාස වලින් යුක්ත වන හෙයින් නිවාස ඉදිකිරීම් හා වැඩිදියුනු කිරීම් පවතී. තවද ඉඩම් කැබලිවීමද වේගවත්ය. ගොඩ ඉඩම් වල සිදුවන පාංශු තට්ටුව කැපීම, ළිං කැපීම හා විවිධ වගාවන්ට බිම් සැකසීම නිසා විශේෂයෙන් මහ කන්නයේ හා හදිසියේ ඇතිවන සංවහන වර්ෂාව සිදුවන අවස්ථා වලදී වේගවත් ව ජලය ගලා යාමත් සමග පාංශු ඛාදනයක් ඇතිවේ. මෙම ඛාදනයත් සමග රොන්මඩ හා පාංශු කොටස් වැව් වල තැම්පත්වීම වැලැක්විය නොහැකිය. අවිධිමත් වගාබිම් ව්‍යාප්තිය එල්ලංගාව තුල දක්නට ඇත. වැව් ඉස්මත්තේ හේන් වගාවද එල්ලංගාවට අහිතකර ලෙස බලපාන්නාවූ තවත් සාදකයකි. මෙහිදී විධිමත් පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කලයුතුය.

## 4.5. මහදිවුල්වැව එල්ලංගාවේ වාරිමාර්ග කළමණාකරනය

එල්ලංගා පද්ධතිය තුල පිහිටි වැව් 07 ක් පිළිබඳව පුනරුත්ථපන කටයුතු සිදුවේ. මීට අමතරව තවත් මෙම වැව් යටතේ ඇති කුඹුරු වගා කරනුයේ කන්න මාරු ක්‍රමයට වේ. මෙම වැව් බොහෙමයක් ඉතා කුඩා වන අතර අක් 02 සිට 14 දක්වා පරාසයකින් යුක්තව වගා බිම් පවතී. එහෙත් එල්ලංගාවේ ජළ කළමනාකරණය පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී මෙම වැව් පිළිබඳව වැදගත් කමක් ඇත. විශේෂයෙන්ම කැලෑව තුල පවතින වැව් පුණරුත්ථාපනය කරන්නේ නම් එහි රදවාගත හැකි ජලධාරිතාවය වැදගත් වේ. එහෙත් මෙම වැව් වල නඩත්තුව ඉතා දුර්වල බව සඳහන් කලයුතුය. ඇලවේලි හා වැව් බැම්මේ නඩත්තුව වසරකට වරක්වත් නිසි පරිදි සිදුනොවේ. මෙයට හේතුව වන්නේ වැව වගා කන්නයට පමනක් නඩත්තු කිරීමයි. එක් ගොවි සංවිධානයකට වැව් කිහිපයක් කළමනාකරණය කිරීමට සිදුවී ඇති බැවින්ද ගොවි සංවිධාන ඇතුලත පවතින අර්බුධයන් හේතුවෙන්ද නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවේ. ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙය එල්ලංගාවේ පවතින තත්වයට සෘජුවම බලපානු ලබයි.

රැලි සහිත භූමියක පවතින එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇත. බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැඳුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත. ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේ දීය. ඇතැම් ජලපාලකයන් එක දිගට ම කිහිප වරක් පත්වෙන්නේ ගොවීන්ගේ කැමැත්තෙනි. ගොවිසංවිධාන රැස්වීම් වල සනපුරණය පිලිබඳව ගැටලු ඇත. පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන අතර නඩත්තුව ගොවීන් වෙත පංගු ලැයිස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලක වෙත මුදල් ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිලිබඳව වගකීමක් නොගැනීමට හේතුවේ.

වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්භ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ බෙත්මට වී වගා කෙරේ. මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබඳව දූර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහභාගිත්වයේ විශේෂ දූර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක් නොපෙනේ. තවද අරමුදල් වර්ධනය වීමක් ද නැත. සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්ධව නීතිමය පියවර නොගැනීමත් මෙහිදී සැලකිල්ලට ගත යුතුය. බොහෝ විට මෙම කාර්යයන් ස්වෙච්ඡා කාර්යයන් බැවින් කාලය කැපකිරීමේ අකමැත්තද ඇත.

එල්ලංගාවේ ගොවි සංවිධාන

| අනු අංකය | ග්‍රාම නිලධාරි වසම | ගොවි සංවිධානයේ නම | ලිපිනය | ලියාපදිංචි අංක |
|---|---|---|---|---|
| 1 | 177 මහදිවුල්වැව | එකමුතු ගොවි සංවිධානය | මහදිවුල්වැව, අඹන්පොල | D/A/D 17/10/10 |
| 2 | | පුබුදු ගොවි සංවිධානය | නිකුන්නැව, අඹන්පොල | D/A/D 17/10/51 |
| 3 | 178 උඩදිවුල්වැව | කෝරුවේගම ගොවි සංවිධානය | කෝරුවේගම, උඩදිවුල්වැව, අඹන්පොල | D/A/D 17/10/15 |
| 4 | | අමා ආදර්ශ ගොවි සංවිධානය | උඩදිවුල්වැව, අඹන්පොල | D/A/D 17/10/27 |
| 5 | | මැඩිල්ල අස්සැද්දුම ගොවි සංවිධානය | උඩදිවුල්වැව, අඹන්පොල | D/A/D 17/10/18 |

වගුව 2 - මූලාශ්‍රය ගොවි ජන සං. දෙ. - නවගත්තේගම


## 4.6. සමාජ ආර්ථික තොරතුරු

අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරාණ යාපහුව රාජධානියට ආසන්නව පිහිටා ඇති අතර ඓතිහාසික සාධක මත අනුරාධපුර යුගයේ දී මෙම ප්‍රදේශයේ ජනාවාස ආරම්භ වූ බව සැලකේ. පීල්ල රාජකීය විහාරය, වෙහෙරලන්දයාය, සඳුන්ගිරි රාජකීය විහාරය, ඇඹුල්ගිරි රාජකීය විහාරය, ගනේගම රාජකීය විහාරය සහ ගවරතිස්සරාමය දේවාලය ඇතුළු පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්ථාන රාශියක් මහදිවුල්වැව එල්ලංගාව ආසන්නයෙන්යෙන්ම පිහිටා ඇත. මෙයින් ගවරතිස්සරාමය විහාරය හා දේවාලය පුරාණ නිදන් වස්තූන් සහිත ඓතිහාසික වටිනාකමක් සහිත පූජා භූමියකි.

අඹන්පොල නගරය අනුරාධපුරය සහ කුරුණෑගල යන ප්‍රධාන නගර දෙකක් අතර මැදිව පිහිටි අම්බලමක් විය. එනම් පුරාණයේ සංචාරකයින්/ වෙළෙන්දන් සඳහා විවේක ස්ථානයක් වන අම්බලම - ( වර්තමාන අඹන්පොල බස් නැවතුම්පොළේ ) පිහිටියේ අඹන්පොල නගරයේය. මේ අනුව අඹන්පොළ යන වර්තමාන ස්ථාන නාමය 'අම්බලන්පොළ' යන්නෙන් ව්‍යුත්පන්නව ඇති බව පැරණි මුතුන් මිත්තන්ගේ සාක්ෂි වල සඳහන් වේ. අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 1988 දී මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උප කාර්යාලයක් ලෙස ආරම්භ කරන ලද අතර 2000 වර්ෂයේදී නව ලේකම් කාර්යාල ගොඩනැගිල්ලක් විවෘත කිරීමත් සමඟ පූර්ණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ක්‍රියාත්මක විය. ගොවිජන සේවා කටයුතු සඳහා අඹන්පොල නගරය මැද අඹන්පොල ගොවිජන සේවා මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වැව් 133 ක් සහ අඹකොළවැව සහ මැඩියාව යන ප්‍රධාන වාරි මාර්ග යෝජනා දෙකක් ඇත. වාරි පද්ධති සහිත එල්ලංගාවේ 22 ක් හෙක්ටයාර 1062 ක භූමි ප්‍රමාණයක පැතිරී ඇත.


සහභාගිත්ව ප්‍රවේශයෙහි  දත්ත වලට අනුව එක් එක් වැව් යටතේ ඇති භාවිතා කළ හැකි පහත් බිම් හෙක්ටයාර් 1539 ක්ද උස් බිම් හෙක්ටයාර 1646 ක්ද පවතී.

මෙම ව්‍යාපෘතිය සඳහා අබන්පොල උණුසුම් ස්ථාන වල තෝරා ගන්නා ලද ප්‍රදේශයේ මුළු ගොවි පවුල් සංඛ්‍යාව 3131 ක් ලෙස PRA විසින් හඳුනාගෙන ඇත. මෙම පවුල්වල ආදායම් විශ්ලේෂණය ධන ශ්‍රේණිගත කිරීම නම් PRA මෙවලම භාවිතයෙන් සිදු කරන ලදී. පහත වගුව ඒ පිළිබඳව දැක්වේ. ඔවුන් නියෝජනය කළ ආදායම් පන්ති වගුව තුල දැක්වේ. ඒ අනුව මාසික ආදායම රුපියල් 1000 සිට 8000 දක්වා පන්තියට අයත් පවුල් 344කි. මෙම පවුල් බොහෝ දුරට අස්ථාවර ආර්ථිකයන් ලෙස හඳුනාගෙන ඇති අතර රජයේ විවිධ සහනාධාර ලබන්නන් ද වේ. මාසික ආදායම රුපියල් 8001 සිට 15000 දක්වා පරාසයට අයත් පවුල් 595ක් ලෙස හඳුනාගෙන ඇත. 15001 ත් 20000 ත් අතර ආදායම් ලබන පවුල් 688 ක් සහ 20001 සිට 25000 දක්වා ආදායම් ලබන පවුල් 971 ක් පමණ වේ. ඒ අනුව මෙම ආදායම් පන්ති තුනේ මුළු පවුල් සංඛ්‍යාවෙන් සියයට 50 කට වඩා වැඩි වේ. මාසික ආදායම 25001 ත් 30,000 ත් අතර පවුල් 378 ක් වන අතර මසකට රුපියල් 30,000 ට වැඩි ආදායමක් ලබන අවසන් පවුල් 155 PRA දත්ත මගින් අනාවරණය වී ඇත. පහත ප්‍රස්ථාරයෙන් ඒ ඒ එල්ලංගා අනුව ප්‍රතිලාභී ව්‍යාප්තිය පැහැදිලි කරයි.



වගුව 3 – අබන්පොල එල්ලංගා පවුල්වල වත්මන් ආදායම් පන්ති

| ආදායම් පන්තිය | ගොවිපවුල් ගණන |
|---|---|
| **1000 -8000** | 344 |
| **8001- 15000** | 595 |
| **15001 -20000** | 688 |
| **20001- 25000** | 971 |
| **25001- 30000** | 378 |
| **300000<** | 155 |
| **මුළු** | 3131 |





වගුව 4 - අබන්පොල එල්ලංගාව තුල දැනට පවතින වී වගා බිම් තත්වය

| | මහ කන්නය හෙක්. | යල කන්නය හෙක්. |
|---|---|---|
| මහදිවුල්වැව | 43 | 17 |

කෘෂිකර්මාන්තය ප්‍රධාන කොට ගත් ආදායම ඉහත වගු සටහනින් දක්වයි. මහදිවුල්වැව මහ කන්නයේ හෙක් 43ක් වගාකර ලබාගන්නා ආදායයයම මෙ.ටො. 115 කි. එලෙසම යල කන්නයේදී එල්ලංගාව තුල වී අස්වැන්න හෙක් 17 කට මෙ.ටො. 46 දක්වා පහල බසී. මෙම තත්වය සලකා බැලීමේදී වාර්ෂික ආදායම මෙලෙස හැසිරීම සාධාරණ විය හැකිය. මෙය ගොවීන්ගේ වාර්ශික ආදායම අඩුවීමට හේතුවේ.

එල්ලංගාව තුල ජීවත්වන ශ්‍රමිකයන් 10% පමණ කම්කරුවන් වශයෙන් ප්‍රදේශයේ ම හා ආසන්න තඹුත්තේගම, අඹන්පොල හා ගල්ගමුව උප නගරවල සේවය කරයි. තවද තොග වෂයෙන් එලවලු හා පලතුරු රැස් කරමින් මෙම නගරවලට අළවි කරන තොග වෙළෙන්දන් කිහිපදෙනෙකු ද එල්ලංගානව තුල ව්‍යාපාර කටයුතු වල නිරතව සිටී.


අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ වී වගා ව්‍යාප්තිය




වගුව 5 - ව්‍යාපෘතියෙන් පසු වී නිෂ්පාදනයේ පුරෝකතනය කරන ලද තොරතුරු

HSAADP ව්‍යාපෘතියෙන් පසු පුරෝකථනය කරන ලද වී නිෂ්පාදනය වැඩි කිරීම.

| එල්ලංගාව | වර්තමාන වී නිෂ්පාදනය මෙ.ටො. | | අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො. | |
|---|---|---|---|---|
| | මහ කන්නය | යල කන්නය | මහ කන්නය | යල කන්නය |
| මහදිවුල්වැව | 115 | 46 | 138 | 83 |
| එකතුව | 161 | | 221 | |




රූප සටහන 08 - ව්‍යාපෘතියෙන් පසු වී නිෂ්පාදනයේ ඉහළ යාම

## 05. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන අභියෝග

මහදිවුල්වැව එල්ලංගා හරස්කඩ චාරිකාවේදී මෙන්ම ගොවි සංවිධාන සමග පැවති සාකච්ඡා වලදී නිලධාරීන් සමග හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලීය නිලධාරීන් සමග පැවති සාකච්ඡා අනුව එල්ලංගාව මුහුණදෙන ප්‍රධන අභියෝග හා ගැටළු පිළිබඳව අවධාරණය කර ගත හැකිවිය. එල්ලංගා හරස්කඩ චාරිකාවෙන් පසුව ගවරතිස්සාරාම විහාරස්ථානයේ ගොවි සංවිධාන හා එහි සාමාජිකයන් සමග පැවති සාකච්ඡාවේදී පහත සඳහන් පොදු ගැටළු හඳුනාගත හැකිවිය. මෙසේ හඳුනාගත් ගැටලු ගොවින් ගේ අදහස අනුව ප්‍රමුඛතාගත කිරීමක්ද කල අතර ඒ අනුව පහත සඳහන් ගැටලු ලේඛණය ගොනුකර ඇත.

### 5.1. එල්ලංගාවේ උග්‍ර ගැටළු ප්‍රමුඛතාවය අනුව

1. වැව් පරිසර පද්ධතියේ තිබූ කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන නොමැති කම ඉස්වැටිය විනාශ කිරීම වැව් ඉවුරු ඛාදනය, රොන්මඩ තැන්පත් වීම.
2. කෘෂි මාර්ග නොමැතිකම හා පවතින මාර්ග අබලන්වීම.

3 සොරොව් නොමැතිකම හා සොරොව් මගින් ජලය කාන්දු වීම.

4 මහදිවුල්වැවෙහි දකුණු පසින් එලිකර හේන් වගාව සිදුකිරීම හා වම් පසින් පොල් සිටුවීම.

5 වැව් වල නිෂ්චිත මායිම් නොමැතිකම.

6 කුණු ඇල නොමැතිකම.

වගු අංක - 11

මහදිවුල්වැව එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරණ ක්‍රියාත්මක සැලැස්මේ සංෂිප්ත වාර්තාව

## 5.2. උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම්

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ගික මැදිහත්වීම් | මැදිහත්වන ආයතන |
|---|---|---|---|
| 1 | අනවසරයෙන් වැව් රක්ෂිත අල්ලාගැනීම | I. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හඳුනා ගැනීම<br>II. ගොවි සංගම් සමග සාකච්චා කිරීම<br>III. අනවසරකරුවන් ලේඛණයක් සකස්කිරීම.<br>IV. ඉවත් කිරීමට දෙනුම්දීම හෝ නීතිමය පියවර ගැනීම | 1. 1CSIAP / (CMC)<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |
| 2 | සොරොව්වෙන් ජලය කාන්දුවීම<br>අළුත් වැව - සොරොව්ව නොමැත<br>කුරුන්දේගම - සොරොව්ව කාන්දුවීම | I. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හඳුනා ගැනීම<br>II. තක්ෂේරු කිරීම<br>III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම | 1. CSIAP / CMC<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ<br>4. ගොවි සංවිධාන |
| 3 | වාන කැඩී ඇත<br>කුරුන්දේගම වැව | I. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හඳුනා ගැනීම<br>II. තක්ෂේරු කිරීම<br>III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම | 1. CSIAP / CMC<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |
| 4 | කෘෂි මාර්ගයක් නැත<br>- හැලබැව වාන දක්වා කි.මී.1.5 ක කෘෂි මාර්ගය අබලන්ව ඇත.<br>කුරුන්දේගම වැව හා යාළු වැව, උඩදිවුල් වැව | I. CMC හිදී සාකච්ඡා කිරීම අදාල ස්ථාන හඳුනා ගැනීම<br>II. තක්ෂේරු කිරීම<br>III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම | 1. CSIAP / (CMC)<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |

| | | | |
|---|---|---|---|
| 5 | කුණු ඇල නොමැතිකම<br><br>(මහදිවුල්වැව මහවැව සඳහා මීටර 800 ක් ) | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. ස්ථාන හඳුනා ගැනීම<br>III. තක්සේරු කිරීම<br>IV. තාක්ෂණික උපදෙස් සැලසුම් කිරීම හා ඉදිකිරීම් ගොවි සංවිධානයට පැවරීම | 1. CSIAP / CMC<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |
| 6 | කට්ටකඩුව හා පෙරහණ නැත<br>(කුරුන්දෙගම වැව 70% ක් පමණ නැත.<br>උඩදිවුල් වැව 90% ක් පමණ නැත.<br>ගස් කපා ඇත.<br>මහදිවුල්වැව 80% ක් පමණ නැත.) | I. CMC හිදී සාකච්ජා කිරීම අදාල ස්ථාන හා ගොවීන් හඳුනා ගැනීම<br>II. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම<br>III. කට්ටකඩුව නිරීක්ෂණය කර ඒකාබද්ධ ක්‍රියාන්විතයකින් කට්ටකඩුව හා පෙරනය වෙන් කිරීම<br>IV. සුදුසු වෘක්ෂලතා ආවරණයක් ඇතිකිරීම සඳහා පැල සිටුවීම | 1. CSIAP / (CMC)<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |

| | | | |
|---|---|---|---|
| 7 | වැව් ඉස්මත්තෙහි පාංශු ඛාදනය නිසා වැව් ගොඩවීම<br><br>මහදිවුල් වැව - අමුනුකොලේ වැව. | I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>II. ස්ථාන හඳුනා ගැනීම<br>III. තාක්ෂණික උපදෙස් අනුව ක්‍රියාත්මක වීම<br>IV. ගොඩවල නඩත්තුව ගොවි සංවිධානයට පැවරී | 1. CSIAP / CMC<br>2. ගොවිජන සං. දෙ.<br>3. පළාත් වාරි. දෙ.<br>4. ගොවි සංවිධාන |

| උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම | දළ පිරිවැය (රු.මි) | කාලරාමුව | | | | | | | | | | | | | | ක්‍රියාත්මක කිරීමේ වගකීම් දරන ආයතන/ආයතනය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෙටිකාලීන | | | | | | මධ්‍යකාලීන | | | | දිගුකාලීන | | | | මැදිහත්වීම් | |
| | | | | | | | | | | | | | | | | ප්‍රධාන | අනෙකුත් |
| 1. ගොවි සංවිධාන හා අදාලආයතන සමග සාකච්චාවක් පැවැත්වීම | 3 | | | | | | | | | | | | | | | | |
| ගොවීන් තෝරා ගැනීම සමග එක්ව සුදුසු ඉඩම් හඳුනා ගැනීම සහ සුදුසු ගොවිතැන් සැලැස්මක් සකස් කිරීම | | | | | | | | | | | | | | | | ගොවි සංවිධානය<br>පලාත් කෘෂි. දෙ.<br>ප්‍රා.ලේ.කා<br>පොලිසිය | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| ගොවීන් දැනුවත්/ පුහුණු කිරීම | | | | | | | | | | | | | | | | | |
| ප්‍රතිපාදන සපයා ගැනීමට බීජ ලබාදීම | | | | | | | | | | | | | | | | | |
| වගාව පිහිටුවීම හා අධීක්ෂණය | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | |
| 2. පරිසර පද්ධතිය සංවර්ධනය කිරීමට නියමිත වැව් තෝරාගැනීම | 6 | | | | | | | | | | | | | | | ගොවි සංවිධානය<br>ගොවිජන සං.දෙ. | ප්‍රා.ලේ.කාර්යාලය<br>ගොවිජන සං. දෙ.<br>පොලිසිය<br>වන සං. දෙ. |
| ඉලක්ක ගත භූමිය තෝරාගැනීම | | | | | | | | | | | | | | | | එම | එම |
| නියමිත කාර්යයන් ගිවිසුම් මගින් බාරදීම | | | | | | | | | | | | | | | | එම | එම |
| නියමිත කාලයට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | | | | | | | එම | එම |
| අධීක්ෂණය | | | | | | | | | | | | | | | | එම | එම |
| 3. එල්ලංගා කළමනාකරණ කමිටුව ඒකාබද්ධ ක්ෂේත්‍රය පරීක්ෂා කිරීම හා කලපු, | 3 | | | | | | | | | | | | | | | එල්ලංගා කළමනාකරණ කමිටුව<br>පොලිසිය | පාර්ශව කරුවන් ගොවි සංවිධාන<br>දේ.සු. වාරි කෘෂි ව්‍යාපෘතිය<br>ඉ.කො. දෙපාර්ථමේන්තුව |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අන්දර ව්‍යාප්ත වූ ප්‍රදේශ නිශ්චය කිරීම | | | | | | | | | | | | | | | | මිනින්දෝරු |
| ආක්‍රමනික ශාඛ (කලපු අන්දර) විනාශ කිරීම පිළිබඳව නියමිත උපදෙස් ලබාදීම | | | | | | | | | | | | | | | එල්ලංගා කළමනාකරණ කමිටුව<br>පොලිසිය | පාර්ශව කරුවන් ගොවි සංවිධාන<br>දේ.සු. වාරි කෘෂි ව්‍යාපෘතිය<br>ඉ.කො. දෙපාර්ථමේන්තුව<br>මිනින්දෝරු |
| අධීක්ෂණය | | | | | | | | | | | | | | | එම | එම |
| 4. මිරිදිය ධීවර අංශය සමග සාකච්ඡාකර සුදුසු වැව් තෝරාගැනීම | 4 | | | | | | | | | | | | | | එල්ලංගා කළමනාකරණ කමිටුව<br>ගොවි සංවිධාන<br>මිරිදිය ධීවර අංශය | දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| නියමිත කාලයට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | | | | | | | | | | | එම | එම |
| මිරිදිය ධීවර කටයුතු පිළිබඳව ගොවීන් 150 ක් සඳහා කළාඔය මිරිදිය ධීවර පුහුණු මඔාස්ථානයේදී පුහුණුවක් ලබාදීම | | | | | | | | | | | | | | | මිරිදිය ධීවර අංශය<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 5. අලුත්වැඩියා කලයුතු කෘෂි මාර්ග පරීක්ෂා කිරීම | 4 | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන<br>දෙපාර්තමේන්තව<br>ප්‍රා.ලේ.කා.<br>ගොවිජන සංවර්ධන | දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>. |
| අස්තමේන්තු ලබාගැනීම | | | | | | | | | | | | | | | | ගොවිජන සංවර්ධන<br>දෙපාර්තමේන්තව<br>ප්‍රා.ලේ.කා.<br>ප්‍රාදේශීය සබාව | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවි සංවිධාන |
| ගොවි සංවිධාන මගින් කොන්ත්‍රාත් ඉටු කිරීමට පැවරීම | | | | | | | | | | | | | | | | ප්‍රා.ලේ.කා.<br>ගොවිජන සංවර්ධන<br>දෙපාර්තමේන්තව<br>ප්‍රාදේශීය සබාව | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 6. ගො.සං. කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන - 1 | 2 | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සං.දෙ. | |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | ප්‍රා.ලේ. කාර්යාලය | |
| ගොවි සංවිධාන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - 2 | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | |
| ගොවි සංවිධාන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන - 3 | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | |
| 7. පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව් දෙකේ මීටර් 400 පමන වන ඇල මාර්ග පරීක්ෂා කර බලා සුදුසු ඇස්තමේන්තුවක් සෑදීම | 2 | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කොන්ත්‍රාත්කරුට පැවරීම හා අධීක්ෂණය | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | ගොවි සංවිධාන<br>දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 8. පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් යටවෙන ගෙවල් 05 ක පදිංචි කරුවන් සමග සාකච්චාවක් පැවැත්වීම | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>පළාත් වාරි. දෙ.<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාල ආයතන වෙත පැවරීමව | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>පළාත් වාරි. දෙ.<br>ගොවිජන සං. දෙ.<br>ප්‍රා. ලේ. කාර්යාලය | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |
| 9. පිච්චෙන්ඩියාව වැව ඉස්මත්තේ සහ පිච්චනේඩියාව කන්දේ | | | | | | | | | | | | | | | | ගොවි සංවිධාන<br>එල්ලංගා කමිටුව | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා වටිනාකමක් ඇති භූමිය අණාරක්ෂිතයි | | | | | | | | | | | | | | | පුරාවිද්‍යා දෙපාර්ථමේන්තුව | |
| | 24 | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |

## 6.0 ඇස්තමේන්තුගත දල වියදම

ක්‍රියාත්මක සැලැස්ම

| අනු අංක | ඇස්තමේන්තුගත වියදම / සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් මහදිවුල්වැව | | ආසන්නවියදම් (රු.මි. ) | 2024 | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාර් . | අප්‍රි. | මැයි | ජුනි | ජූලි | අගෝ . | සැප් . |
| 1 | යල කන්නයේ අක් 300 ක අතිරේක ආහාර බෝග ආදර්ෂ වගාවක් සැලසුම්කිරීම හා ගොවීන් 125 ක් පුහුණු කිරීම. | | 3 | | | | | | | |
| 2 | වැව් 12ක පරිසර පද්ධතිය දුර්වලයි (12 ha. කට්ටකඩුව සංවර්ධනය, හෙක්. 02 ක ගස්ගොම්මන පිහිටුවීම, 05 km පෙරහන පිහිටුවීම, 6 km ක පාංශු සංරක්ෂණ වැටි දැමීම. | | 6 | | | | | | | |
| 3 | හල්මිල්ල වැව හා සෙන්ගක්කුලම වැව් වල ආක්‍රමණශීලී ශාක (කළපු අන්දර) හෙක්ටයාර 10 ක් ඉවත්කිරීම. | | 3 | | | | | | | |
| 4 | වැව් 12 ක මිරිදිය ධීවර මත්ස්‍ය සම්පත සංවර්ධනය සඳහා ඇඟිල්ලන් 400000 ක් මුදා හැරීම හා ගොවීන් 150 ක් පුහුණු කිරීම (කළා වැව මිරිදියධීවර පුහුණු මධ්‍යස්ථානය). | | 4 | | | | | | | |
| 5 | මැදවච්චිය එල්ලංගාවේ කි.මී. 04 ක අභ්‍යන්තර මාර්ග සංවර්ධනය (Kuruketiyawa road). | | 4 | | | | | | | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | ගොවි සංවිධාන 03 ක කළමනාකරණය දියුනු කිරීම සඳහා පුහුණු වැඩසටන් 3 ක් පැවැත්වීම. | | 2 | | | | | | | |
| 7 | පිච්චෙන්ඩියාව හා සෙන්ගක්කුලම වැව්දෙකේ මීටර් - 400 පමන වන ඇල මාර්ග සංවර්ධනය. | | 2 | | | | | | | |
| 8 | පිච්චෙන්ඩියාව වැවේ වාන් වතුරෙන් යට වෙන ගෙවල් 05 ක පදිංඡචි කරුවන්ගේ ගැටලුව විසදීමට මැදිහත්වී. | | | | | | | | | |
| 9 | අනාරක්ෂිතව පවතින මොට්ටමොලේ ගල පුරාවිද්‍යා රක්ෂිතයේ ආරක්ෂාව තහාවුරු කිරීමග | | | | | | | | | |
| | මුළු | | 24 | | | | | | | |

මගේ අංකය / எனது இல. / My No. 7/3/9/CMC/2023 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2023.08. 03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.**
**Cascade Management Committee (CMC) Establishment & Continuity**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැදින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැදුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැදින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව **එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු** [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ

**i.** එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

**ii.** වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම්, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම්, භූගත ජල මට්ටම් ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ප්‍රජාතන්ත්‍ර පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශිය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායි ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරී හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ.යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමානයාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)